# අනුරාධපුර නගරය ආශ්‍රිත කාර්මික උරුමය

**කේ.එන්. කරුණාතිලක**[1]

අනුරාධපුරය, අග්‍රගන්‍ය සංස්කෘතික උරුමයන් රැසකින් සෑදි ශ්‍රී ලාංකේය ඉතිහාසයේ මුල්ම අගනගරයයි. ශ්‍රී ලංකාවේ ප්‍රථම රාජධානිය වූ අනුරාධපුරයෙහි වැදගත්කම හුදෙක් ඓතිහාසිකත්වයට පමණක් සීමා වුවක් නොවේ. මේ පෞරාණික නගරයේ දක්නට ලැබෙන ගොඩනැගිලි ස්මාරක විශේෂයෙන් ශ්‍රී ලාංකිකයන් ගේ ද ලෝකවාසීන්ගේ ද අවධානයට ලක් වී ඇත. අද වන විට ද ඉතිරි වී ඇති ශේෂයන් ඔස්සේ මෙම නගරය මනා පැවැත්මකින් මෙන්ම සැලසුම්කරණයකින් යුක්ත වූ බව තවදුරටත් පැහැදිලි වේ. මෙසේ නිර්මාණය වී ඇති නව නගර සැලසුම බිහිවීමට බොහෝ කලක සිට වර්තමානය තෙක් ක්‍රමානුකූලව විකාශනය වී ඇත. නව නගරය සැලසුම බිහිවීමට පදනම් වී ඇත්තේ අනුරාධපුර පැරණි නගරයයි. ඓතිහාසික උරුමයකින් හෙබි අනුරාධපුර, බ්‍රිතාන්‍ය යුගය තුළදී විවිධ සංවර්ධන කටයුතුවලට ලක් වී තිබේ. ඒ අනුව 1800 සිට 1950 දක්වා කාලය තුළ දී එම සංවර්ධන කටයුතු යටතේ අපට දයාද වූ කාර්මික උරුමයන් ද අනුරාධපුර නගරය ආශ්‍රිතව හඳුනාගත හැකිය. මේ සඳහා අනුරාධපුර දුම්රිය ස්ථානය, අනුරාධපුර මහමාර්ග පද්ධතිය හා මාර්ග ප්‍රවාහනය, අනුරාධපුර නගරය ආශ්‍රිත ජන සන්නිවේදන කටයුතු, වෙනත් නිර්මාණ සහ ගොඩනැගිලි තෝරාගත් කාර්මික උරුම ස්ථාන වේ. අනුරාධපුර නගරය තුළ කාර්මික උරුම සම්බන්ධ අධ්‍යයනය තුළ අනුරාධපුර දුම්රිය ස්ථානය මුල් ස්ථානයේම දැකගත හැකිය. දුම්රිය ස්ථානය ආශ්‍රිතව ඇති කාර්මික උරුමයන් ලෙස දුම්රිය පාලක මැදිරිය, ධාවනාගාරය, දුම්රිය නිල නිවාස, ඉන්ධන ගබඩා කාමර, ජල පොම්පාගාර, කැබින් කාමර ආදිය ද දක්නට ලැබේ. මහමාර්ග පද්ධතිය හා මාර්ග ප්‍රවාහනය යටතේ පාලම් හා බොක්කු, මාර්ග සංඥා, පැරණි ප්‍රවාහන මාධ්‍යයන්, සැතපුම් කණු ආදිය පිළිබඳව අධ්‍යයනය කරනු ලැබේ. අනුරාධපුර නගරය ආශ්‍රිත ජන සන්නිවේදන කටයුතු සම්බන්ධයෙන් අධ්‍යයනය සිදු කරන ලදි. මේ යටතේ පැරණි මුද්‍රණාල, පැරණි සිනමාහල්, රජරට ගුවන් විදුලි සේවයේ පැරණි ශබ්ද විකාශන යන්ත්‍ර, පැරණි දුරකථන, පැරණි මයික්‍රොෆෝන ආදිය පිළිබඳව අධ්‍යයනය කරන ලදී. අනුරාධපුර කාර්මික උරුමය අදාළ වෙනත් නිර්මාණ සහ ගොඩනැගිලි යටතේ බ්‍රිතාන්‍ය පාලන අවධියේ ඉදි කරන ලද පූජා නගරයේ පැවති පැරණි නගර සභාව වර්තමානයේ ජේතවන කෞතුකාගාරය, පැරණි රෝහල, පැරණි තැපැල් කාර්යාලය, ග්‍රාම නිලධාරි කාර්යාලය, බසවක්කුලම වලව්ව, වැව්වල නම් සඳහන් පුවරු, පැරණි ප්‍රදේශීය ලේකම් කාර්යාලය වර්තමානයේ අනුරාධපුර කෞතුකාගාරය, අනුරාධපුර තානායම ආණ්ඩුකාරවරයාගේ නිල නිවාසය, නුවර වැව සොරොව්ව, අනුරාධපුර පැරණි බන්ධනාගාරය, සහකාර ඒජන්ත බංගලාව වර්තමානයේ ජන කෞතුකාගාරය යන මෙම අනුරාධපුර කාර්මික උරුම ස්ථාන පිළිබඳව අධ්‍යයනය කිරීමේදී එම තොරතුරු සනාථ කිරීමට වැදගත් විය.

ප්‍රමුඛ පද : කාර්මික පුරාවිද්‍යාව, ශ්‍රී ලංකාවේ කාර්මික උරුමය, බ්‍රිතාන්‍ය පාලන සමය, ආදි නූතන අවධිය

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
*kalpaninirukshika8@gmail.com*